ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
இலங்கை தேசிய கூட்டுறவுச் சபை
NATIONAL CO-OPERATIVE COUNCIL OF SRI LANKA
Affiliated to the International Co-operative Alliance

National Co-operative Council of Sri Lanka
Reg.No: කො2490-1972.07.26

coop
International Co-operative Alliance
Asia & Pacific
Co-operative Enterprises Build a Better World

මගේ අංකය / எமது இல. / My No. } එන්සිසි/අපු/නිපා/නීනිඩි/01
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2021 ජුලි 15

සියලුම මුදුන් මට්ටමේ සමුපකාර සමිති සංගම් වල,

සහ සියලුම විවිධ සේවා / සණස / අනෙකුත් සමුපකාර සමිති වල,

සාමාන්‍යාධිකාරී මහත්ම / මහත්මීන් වෙත,

## නීති නියෝජිත ඩිප්ලෝමා පාඨමාලාව 2021 / 2022
## Diploma Course on Legal Representatives 2021 / 2022

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය විසින් සමුපකාර සමිතිවල නීති නියෝජිත කටයුතු වෙනුවෙන් සේවය සලසන විධායක නිලධාරී මණ්ඩල සහ සමුපකාර ආශ්‍රිත සේවා මණ්ඩලයන්හි දැනුම සංවර්ධනය වෙනුවෙන් ආරම්භ කෙරෙන උක්ත පාඨමාලාව සඳහා පුහුණුලාභීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන බව කාරුණිකව දන්වමි.

මෙම පාඨමාලාව හැදෑරීම සමුපකාර ක්ෂේත්‍රයේ නීති නියෝජිත කාර්යයන්හි නියුතු වූවනට සිය වෘත්තිමයභාවය ඉහල නංවා ගැනීමටත්, සමුපකාර සේවකයන් සඳහා උසස්වීම් හා ඉහල තනතුරු සඳහා අයදුම්කිරීමේදී සුදුසුකමක් ලෙසත්, මෙම පාඨමාලාව සැළසුම් කර ඇත.

මෙම පාඨමාලාවේ විෂයය ඉගැන්වීම් කටයුතු අපගේ කුරුණෑගල සහ කොළඹ කළාපීය පුහුණු මධ්‍යස්ථානයන්හිදී පැවැත්වෙන අතර පුහුණුලාභීන් වෙත දේශන / සම්මන්ත්‍රණ සහ ක්ෂේත්‍ර අධ්‍යයනයන් ප්‍රායෝගික සිද්ධි අධ්‍යයනයන් මගින් ක්ෂේත්‍රයේ ඉතා පළපුරුදු සම්පත්දායක මණ්ඩලයක් මගින් පාඨමාලාලාභීන් පුහුණු කිරීමට සැළසුම් කර ඇත,

පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සහ අදාළ අයදුම්පත්‍රය මේ සමග යොමු කර ඇත. ඒ අනුව අදාළ මූලික සුදුසකම් සපුරා ඇති මෙම පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර 2021 - 08 - 15 දිනට පෙර අප වෙත ලැබීමට සලස්වන මෙන් වැඩිදුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.



ප්‍රධාන විධායක නිලධාරී

පිටපත්
01 ගරු සභාපති තුමා - ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
( කාරුණික දැන ගැනීම සඳහා )

සමුපකාර මන්දිරය, 455, ගාලු පාර, කොළඹ 03. கூட்டுறவு இல்லம் 455, காலி வீதி, கொழும்பு 03. 'CO-OP HOUSE' 455, Galle Road, Colombo 03, Sri Lanka
දුරකථන / தொலைபேசி / Telephone } 011-2585496 / 011-2585034 / 011-2589307 / 011-2587062
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2584638 / 011-2587062
වෙබ් / வெப் / Web } www.slncc.lk
ඊ.මේල් / ஈ.மெல் / E.mail } nccsec@sltnet.lk

National Co-operative Council of Sri Lanka

# නීති නියෝජිත ඩිප්ලෝමා පාඨමාලාව 2021 / 2022
# Diploma Course on Legal Representatives 2021 / 2022

## විස්තර පත්‍රිකාව

| | | |
|---|---|---|
| 01. | **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | 2021 අගෝස්තු 15 |
| 02. | **ඉල්ලුම් පත්‍ර** | මේ සමඟ අමුණා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 අගෝස්තු 15 දිනට පෙර එවිය යුතුය. |
| 03. | **ඉල්ලුම් පත්‍ර එවිය යුතු ලිපිනය** | **ප්‍රධාන විධායක නිලධාරි**<br>**ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය**<br>**අංක 455, සමුපකාර මන්දිරය,**<br>**ගාලු පාර, කොළඹ 03.**<br>හෝ<br>**ncceducationsrilanka@gmail.com** |
| 04. | **පාඨමාලා ගාස්තු සහ විභාග ගාස්තු** | රු. 40,000/- කි. මෙය මුදලින් හෝ "ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය" නමින් ලියූ චෙක්පතකින් පාඨමාලාව ආරම්භ කරන දිනයේදී ගෙවිය යුතුය.<br>නේවාසික වියදම් සහ ආහාර පාන සඳහා වියදම් පුහුණුලාභීන් විසින් දරා ගත යුතුය. |
| 05. | **පාඨමාලා කාලය** | වසර එකකි. මසකට දින 04 බැගින් දේශන පැවැත්වේ.<br>කුරුණෑගල - සිකුරාදා සහ සෙනසුරාදා (දෙසතියකට වරක්)<br>( කුරුණෑගල මධ්‍යස්ථානයේ පැවැත්වෙන පාඨමාලාව මසකට දින දෙකක් කුරුණෑගල මධ්‍යස්ථානයේදී සහ මසකට දින දෙකක් අනුරාධපුර මධ්‍යස්ථානයේදී වශයෙන් පැවැත්වීමට අපේක්ෂා කෙරේ. )<br>කොළඹ - සඳුදා සහ අඟහරුවාදා (දෙසතියකට වරක්) |
| 06. | **පුහුණුවේ ප්‍රතිලාභ** | : |

1. පුහුණුලාභීන්ට ආරවුල් බේරුම්කරණය හා විනය කාර්යපටිපාටිය විෂයය ක්ෂේත්‍රය හඳුනාගැනීමට හැකිවීම.

2. ආරවුල් විභාගයකදී හා විනය පරීක්ෂණයේදී පැමිණිල්ලේ නියෝජිතයෙකු විසින් ඉටුකල යුතු කාර්යයන් වඩාත් උචිත ශිල්ප ක්‍රම භාවිතා කරමින් ඉටු කිරීමට හැකිවීම.

3. පැමිණිල්ලට වාසිදායක ප්‍රදානයන් අභියාචනා තීරණ හා විනය පරීක්ෂණ නිගමන ලබා ගැනීමටත් ඊට අදාල ලේඛන නිවැරදිව නීත්‍යානුකූලව පිළියෙල කිරීමට හැකිවීම.

**07. මූලික විෂයය අන්තර්ගතයන්**

- සමුපකාර සන්දර්භය භාවිතය ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය
  - සමුපකාර අනන්‍යතා ප්‍රකාශය හා එහි අන්තර්ගතය සහ භාවිතය
  - ප්‍රාථමික, ද්විතියක හා ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන හා ඒවායේ සංයුතිය හා ක්‍රියාකාරීත්වය

- පරිපාලන නීතිය හා සමුපකාර කටයුතු වලදී එහි ඇති බලපෑම
  - හැඳින්වීම හා විෂයය පථය

- ස්වභාවික යුක්ති මූලධර්ම
    - බලාතික්‍රමණ සිද්ධාන්තය
    - ආරවුල් බේරුම්කරණයේදි හා විනය කටයුතු වලදි එහි බලපෑම
    - ස්වභාවික යුක්ති මූලධර්ම අනුගමනය නොකිරීමේ ඵල විපාක

- සමුපකාර ආරවුල් බේරුම්කරණ විෂයය පථය
    - සංශෝධන සමග කියවෙන සමුපකාර පනත හා පළාත් සමුපකාර ප්‍රඥප්ති වල අධිකරණ විමර්ශන හා චක්‍රලේඛ හා අත්පොත් වල සඳහන් මූලාශ්‍ර
    - ආරවුල් හා බේරුම්කරණය හැඳින්වීම
    - සමුපකාර සමිති වල පැන නගින මූල්‍ය හා මූල්‍ය නොවන ආරවුල්
    - ආරවුල් බේරුම්කරණයට රෙජිස්ට්‍රාර්ට ඇති බලය හා එහි සීමාවන්
    - ආරවුලක් බේරුම්කරණයට යොමු කිරීමේදි සමුපකාර සමිතියක කාර්යභාරය
    - බේරුම්කරුවන් පත් කිරීම
    - ආරවුල් විභාගයක නීති නියෝජිතයා
    - ප්‍රදානයක ඇති නෛතික බලය
    - අභියාචනා පටිපාටිය

- ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයා හා සමුපකාර සේවා නියුක්තිකයා
    - රාජ්‍ය, පළාත් රාජ්‍ය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, පුද්ගලික අංශවල සේවකයන් හා ඔවුන්ට බලපාන සේවා කොන්දේසි
    - සමුපකාර සේවයේ ආරම්භය හා විකාශනය
    - සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම හා කොමිෂන් සභාව සතු බලතල
    - සමුපකාර සේවා යෝජකයා හා සේවා නියුක්තිකයා

- සමුපකාර සේවක විනය කාර්යය පටිපාටිය
    - මූලාශ්‍ර
    - විෂමාචාරය
    - විනය වැරදි
    - මූලික විමර්ශන
    - චෝදනා පත්‍ර
    - විනිශ්චය සභා පත් කිරීම
    - විනය පරීක්ෂණයක නීති  නියෝජිතයා

- ආරවුල් විභාගයක හා විනය පරීක්ෂණයක සාක්ෂි
    - සාක්ෂි ආඥා පනත
    - සාක්ෂි හැඳින්වීම
    - සාක්ෂි වර්ග

## 08. විභාග කොන්දේසි

විභාගයට පෙනී සිටීම සඳහා සෑම පුහුණුලාභියෙකුම 80%ක් වත් දේශන වලට සහභාගි විය යුතු අතර සම්පත්දායකයින් විසින් පවරනු ලබන අභ්‍යාස හා පැවරුම් නියමිත දිනට ඉදිරිපත් කල යුතු අතර අවසාන පරීක්ෂණයේදී අභ්‍යාස හා පැවරුම් වලින් ලබා ගත් ලකුණු සැලකිල්ලට ගනු ලැබේ.

## 09. පාඨමාලා පැවැත්වෙන ස්ථාන හා ලිපිනයන්

කුරුණෑගල : සමුපකාර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, 150, නුවර පාර, කුරුණෑගල.
විදුහල්පති 037 2 223687 / 071 2 149 600

අනුරාධපුරය : සමුපකාර සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, 519/15, ජයන්ති මාවත, අනුරාධපුරය.
විදුහල්පති 025 2 235559 / 071 6 972 895

කොළඹ : ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය, 455, ගාලු පාර කොළඹ 3.
විදුහල්පති 011 2 585496 / 071 6 335 120

## 10. සුදුසුකම්

10.1 සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) පාඨමාලාව සමත්ව අවුරුදු 05ක විධායක හෝ මාණ්ඩලික ශ්‍රේණියේ අඛණ්ඩ සේවයක් ලබා තිබීම.

10.2 සමුපකාර සමිතියක සභාපති ධුරයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිතයෙකු ලෙස වසර 03ක අඛණ්ඩ සේවා කාලයක් තිබීම.

10.3 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි ඩිප්ලෝමාලාභියෙකු වීම.

## 11 වෙනත් කරුණු :

අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර හා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු වැරදි බව අනාවරණය වුවහොත් ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. පුහුණුවට තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් තිබෙන අපේක්ෂකයින් පමණක් කැඳවනු ලැබේ. ඒ සඳහා ගමන් වියදම් හෝ වෙනත් කිසිම දීමනාවක් ගෙවනු නොලැබේ.

ප්‍රධාන විධායක නිළධාරී

**පාඨමාලා මෙහෙයවීම**

- ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය

National Co-operative Council of Sri Lanka

# ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
# இலங்கை தேசிய கூட்டுறவுச் சபை
# NATIONAL CO-OPERATIVE COUNCIL OF SRI LANKA

**නීති නියෝජිත ඩිප්ලෝමා පාඨමාලාව 2021 / 2022**

**Diploma Course on Legal Representatives 2021 / 2022**

## ඉල්ලුම් පත්‍රය

01. (අ) මුලකුරු සමඟ නම : ..................................................
මහතා / මහත්මිය / මෙනවිය

(ආ) මුල් අකුරු වලින් කියවෙන නම් : ..................................................

..................................................

(ඇ) සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන් ) ..................................................

( ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි ..................................................

ඉතා පැහැදිලිව ) ..................................................

02. (අ) රාජකාරි ලිපිනය : ..................................................

: ..................................................

(ආ) රාජකාරි දුරකථන අංකය : .............................. ෆැක්ස් ..............................

(ඇ) රාජකාරී ඉ මේල් ලිපිනය : ..................................................

(ඈ) පෞද්ගලික ලිපිනය : ..................................................

: ..................................................

(ඉ) පෞද්ගලික දුරකථන අංකය : .............................. ජංගම ..............................

(ඊ) වට්ස්ඇප් දුරකථන අංකය : ..............................

(උ) පෞද්ගලික ඉ මේල් ලිපිනය : ..................................................

03. උපන් දිනය : ..................................................

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : ..................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

නිකුත් කල දිනය (ජායා පිටපත් අමුණන්න) : ..................................................

04. අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් :

| අනුඅංකය | උපාධියේ / ඩිප්ලෝමාවේ / අදාල විභාගයේ පරීක්ෂණයේ පාඨමාලාවේ නම | වර්ෂය | මාධ්‍යය | අධ්‍යාපන ආයතනයේ නම | හදාරන ලද විෂයයන් | සමාර්ථයේ ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

05. සේවා පළපුරුද්ද :

| අනුඅංකය | සමිතියේ නම | තනතුර | සේවා ගණය | අදාල තනතුරෙහි සේවා කාලය | රාජකාරියෙහි සේවයෙහි කාර්ය භාරය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

06. අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා :

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

07. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : 2021 ............................................ ..................................................

අත්සන

08. (සමුපකාර සමිති සේවකයන් සඳහා පමණි)

**සමුපකාර සමිති සහතිකය**

.................................................................................................................................... මයා / මිය/ මෙනවිය

(අයදුම්කරුගේ නම)

අප සමුපකාර සමිතියේ ........................................................................................ දින සිට සේවය කරන අතර, ඉහත පුහුණුව සඳහා ඔහු /ඇය තෝරා ගනු ලැබුවහොත් පුහුණුව සඳහා සහභාගි කරවිය හැකි බව 2021 ............................. දින රැස්වූ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව තිරණය කර ඇත.

............................................................ ............................................................

ගරු සභාපති

සාමාන්‍යාධිකාරී / ලේකම්

(මුද්‍රාව සමඟ)

දිනය : 2021 / ............... / ...............

---

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :-**

ලැබුණු මුදල : රු. .....................................................

කුවිතාන්සි අංකය : ............................................................ දිනය : ..............................................